www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එඩ්වඩ් ස්නෝඩ්න්ට අත නොතබනු!

## Hands off Edward Snowden!

**2013 ජූලි 09**

ඔබාමා පාලනයත් එක්සත් ජනපද මිලිටරිය හා ඔත්තු සේවාවනුත්, එඩ්වඩ් ස්නෝඩ්න් අල්ලා ගැනීම පිනිස ලෝක පරිමානව අතිශය ආක්‍රමනකාරී ව්‍යාපාරයක් දියත් කර තිබේ. ඒ සමග ම හා නිසැකව ම, වොෂින්ටනය විසින් යොදනු ලබන උත්සන්න පීඩනයට ප්‍රතිචාර වශයෙන් රුසියානු බලධාරීන්, පසුගිය දෙසතිය පුරා මොස්කව් ජාත්‍යන්තර ගුවන් තොටුපලේ කොටුවී සිටින හිටපු ජාතික ආරක්ෂක ඒජන්සියේ කොන්ත්‍රාත්කරුගේ පිටව යාම අවශ්‍ය බව ඇඟවුම් කරන එන්ට එන්ටම දැඩි වන සංඥා නිකුත් කරමින් සිටිති.

ස්නෝඩ්න්ගේ ජීවිතය අනතුරට මුහුනපා ඇත. වොෂින්ටනයේ ජාත්‍යන්තර මිනිස් දඩයමේ රුදුරු ස්වභාවය, ඇමරිකානු පුරවැසියන්ගේ පමනක් නොව, බටහිර යුරෝපයේ සිට බ්‍රසීලය දක්වා ලොව පුරාම ජනතාව හා ආන්ඩු, දැවැන්ත ව්‍යවස්ථා විරෝධී හා නීති විරෝධී ඔත්තු බැලීමකට ලක්ව සිටින බව හෙලිදරව් කරන සාක්ෂි මාලාවක් ප්‍රසිද්ධ කිරීමත් සමග, උත්සන්න කෙරී ඇත.

ඔබාමා පාලනයේ ජාත්‍යන්තර අකටයුතුකම් හා මැරවර ක්‍රියා මගින්, එක්සත් ජනපද ආන්ඩුවේ අත්අඩංගුවට පත්වීමෙන් එඩ්වඩ් ස්නෝඩන්ට මුහුන පෑමට සිදුවන තත්වයට එරෙහිව කොන්දේසි විරහිතව රැකවරනය ලබාගැනීමට ඔහු සතු අයිතිය පිලිබඳ කාරනය ඕනෑවටත් වඩා ඒත්තු ගන්වා ඇතුවා පමනි.

යුරෝපීය බලවතුන් ගනනාවක්ම පසුගිය සතියේ එක්සත් ජනපද මධ්‍යම රහස් ඔත්තු සේවය වෙනුවෙන් කටයුතු කරමින් බොලිවියානු ජනාධිපති ඊවෝ මොරාලෙස් ගමන් ගත් ගුවන් යානය බලහත්කාරයෙන් බිමට බැස්සවීමත් සමග මෙය අතිශයින්ම පැහැදිලි විය.

යුද ප්‍රකාශ කිරීමකට සමානවූ මෙම අසාමාන්‍ය ක්‍රියාව පිටුපස පැවති අඩමානය වූයේ ස්නෝඩන් එම ගුවන් යානය තුල සිටි බවට මතුවූ සැකයයි.

එවන් සැක සාංකා සැබවින්ම පැවතියා ද යන්න පැහැදිලි නැත. නොඑසේ නම් වොෂින්ටනය, ස්නෝඩන් ඉල්ලා සිටි රැකවරනය දීමට බොලිවියාව සූදානම්ව සිටි බවත්, එවන් ක්‍රියාවකින් වැලකී සිටින ලෙස මොරාලෙස්ගේ උදාහරනය යොදාගනිමින් අනෙකුත් රාජ්‍ය නායකයින් වෙත පනිවිඩයක් යැවීමට අදහස් කලා ද යන්න ද අපැහැදිලිය.

එහෙත් එක දෙයක් පැහැදිලිය. එනම්, බොලිවියානු ජනාධිපති ගමන් ගත්, ඉන්ධන අඩුවෙමින් තිබුනු ගුවන් යානයේ ගමන් මාර්ගය ගුවනේදීම වෙනස්කර, ඔහුගේ ජීවිතය අනතුරේ හෙලීම එක්සත් ජනපද ආන්ඩුවේ අභිප්‍රාය වී නම් ඔවුන්, තොරතුරු හෙලිදරව් කිරීම නතර කිරීමට ස්නෝඩන්ම මරා දැමීමට සූදානම්ව සිටි බවයි.

මොරාලෙස්ට එරෙහිව සිදුකල මැර ක්‍රියාව නිසා හටගත් කෝපය හමුවේ එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතය, ස්නෝඩන් සිද්ධිය මුල්කරගෙන අනෙකුත් ආන්ඩු වලට විරුද්ධව තර්ජනයේ හා අඩන්තේට්ටම් කිරීමේ ව්‍යාපාරයක් පටන් ගත්තේය.

ස්නෝඩන්ට එරෙහි දඩයම මත ද්විපාර්ශවික එක්සත් කමක් පෙන්නුම් කරමින් එක්සත් ජනපදයේ ප්‍රධාන දෙපක්ෂයේම ප්‍රමුඛ සාමාජිකයෝ 07දා, ලතින් ඇමරිකාවේ දිගු කාලීන හා සාපරාධී ආක්‍රමනයේ අධිරාජ්‍යවාදී ඉතිහාසය දෝංකාර නැංවූ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකට එක් වූහ.

මන්ත්‍රී මන්ඩල බුද්ධි අංශ කමිටුවේ රිපබ්ලිකානු සභාපති, කොන්ග්‍රස් සභික මයික් රොගර්ස් මෙසේ පැවසීය. "මෙය බැරෑරුම් ප්‍රශ්නයකි. එක්සත් ජනපදය සමග වෙලඳාමෙන් නිශ්චිත ප්‍රතිලාභ හිමිකර ගන්නා එම ලතින් ඇමරිකානු රටවල් වලට, එවන් හැසිරීමක් කිසේත්ම ඉවසන්නේ නැති බව පෙන්වන පැහැදිලි පනිවිඩය යැවීමට අපි පියවර ගත යුත්තෙමු."

එසේම සෙනේට් සභාවේ විදේශ සම්බන්ධතා කමිටුවේ ඩිමොක්‍රටික් පක්ෂ සභාපති රොබට් මෙනන්ඩෙස්, කිසියම් රටක් ස්නෝඩන්ට රැකවරන සැලසීමට යන්නේ නම් එරට, "එක්සත් ජනපදයට කෙලින්ම විරුද්ධව යන බව දැනගත යුතු" යයි පැවසීය.

ඇමරිකානු ආන්ඩුවේ මැරවරකම් ස්නෝඩන් විසින් ගෙන ඇති මූලධර්මාත්මක පියවරයන්ට සහමුලින්ම

පටහැනිය. ගාඩියන් පුවත්පත පසුගිය මාසයේ ප්‍රසිද්ධ කල ස්නෝඩන්ගේ වාර්තාගත දෙවන සම්මුඛ සාකච්ඡාව තුලදී, හිටපු ජාතික ආරක්ෂක ආයතනයේ සේවක තමන්ගේම දේශපාලන පරිනාමයේ ආස්ථානයෙන් මෙසේ පැහැදිලි කලේය. තම කටයුතු, "විදේශයන්හි පීඩිත මිනිසුන්ගේ විමුක්තිය" සඳහා තමන් කටයුතු කරන බව පැවසූ එක්සත් ජනපදයේ නිල කියාපැම්වල "උදාරත්වය" ගැන තැබූ විශ්වාසය මත පදනම් කල බව පැවසූ ඔහු, "දැන් අප සැබවින්ම සම්බන්ධවී සිටින්නේ ගෝලීය මහජන විඥානයේ මට්ටම සැකසීමේ අටියෙන් ජනතාව නොමග යැවීමට බව වටහා ගනිමින් සිටිමු."

"මා කියන සෑම දෙයක්ම, මා කරන සෑම දෙයක්ම, මා කතා කරන සෑම අයෙකු පිලිබඳවම, නිර්මානශීලිත්වයේ හෝ ආදරයේ එසේත් නැතිනම් මිත්‍රත්වයේ, සෑම දෙයක්ම වාර්තාගත කරන ලෝකයක මට ජීවත් වීමට අවශ්‍ය නො වේ. එය මා ගොඩනැගීමට ප්‍රිය කරන දෙයක් හෝ ජීවත් වීමට කැමතිවන තත්වයක් නො වේ." යයි පවසන විට ස්නෝඩන් කතා කලේ ලොව පුරා සිටින මිලියන සංඛ්‍යාත මිනිසුන් වෙනුවෙනි.

"අපගේ නායකත්වය විසින් ආන්ඩුවේ අත්තනෝමතිකත්වය නිවැරදි කරන තෙක්" තමන් බලා සිටියේ යයි ඔහු තවදුරටත් පැවසීය. එහෙත් " අපට එවැන්නක් සිදුවනු දැකගත නොහැකි විය. සැබවින්ම අප සිදුකරමින් සිටින්නේ පූර්වයෙන් පැවති ආන්ඩුවල අත්තනෝමතිකත්වය වැඩි දියුනු කිරීමත්, යමෙක් එය නතර කිරීමට ඉදිරිපත් නොවන තතු යටතේ එය වඩාත් නරක හා ආක්‍රමනික තත්වයක් කරා ගෙනයාමත් ය." යයි ඔහු වැඩිදුරටත් පැවසීය.

මෙහිදී ප්‍රකාශ කෙරෙන්නේ හුදෙක් තනි පුද්ගලයෙකුගේ අදහස් නොව සමස්ත පරම්පරාවකගේම ජීවන අත්දැකීම්ය. ඔවුන් දේශපාලනිකව දැනුවත්වී ඇත්තේ, වොෂින්ටනයේ " ත්‍රස්තවාදයට එරෙහි ගෝලීය යුද්ධයේ" සන්දර්භය තුලය. ඔවුන් දැක ඇත්තේ ඉරාකයේ, ඇෆ්ගනිස්ථානයේ ආක්‍රමනික යුද්ධ දියත් කරනුය. ඒවායේ ගොදුරු බවට පත්වූවන් මිලියන ගනනක් වනු හා ධවල මන්දිරය විසින් වධ බන්ධන හා සාපරාධිත්වය වගා දිගා කරනුය.

බුෂ් පාලනය යටතේ සිදු කරන ලද අපරාධ ඔබාමා යටතේ වඩාත් ගැඹුරු වූවා පමනි. බලාපොරොත්තුවේ හා වෙනසේ කප්පිත්තා ලෙස හුවා දක්වන ලද්දේ ඔහුය. එහෙත්, ගෝලීය ඩ්‍රෝන් ඝාතන වැඩසටහන් නිරීක්ෂනය කලේ, නීති විරෝධී ඔත්තු බැලීම් බෙහෙවින්ම පුලුල් කලේ, ලිබියාවට හා සිරියාවට එරෙහිව ආක්‍රමනකාරී නව යුද්ධ දියත් කලේ එම පුද්ගලයා විසින්ම ය.

මෙහි ප්‍රතිපලය වූයේ, ජනගහනයේ අති බහුතරය වන වැඩකරන ජනතාවට එරෙහිව මූල්‍ය වංශාධිපතීන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමට කැපවූ, එක්සත් ජනපදයේ සමස්ත දේශපාලන හා ආර්ථික පදනම කෙරෙහි මිලියන සංඛ්‍යාත තරුනයින් ක්‍රියාත්මකව ම සතුරු වීමත්, මහා ව්‍යාපාරිකයේ පක්ෂ දෙකෙන්ම වියෝවීමත් ය.

ස්නෝඩන්ට එරෙහි මිනිස් දඩයමේ පලිගැනීම හා උන්මාදය පෙන්නුම් කරන්නේ, හුදෙක් ස්නෝඩන් ගැන පමනක් නොව, ඔහුගේ දැක්ම බෙදා හදා ගන්නා කම්කරුවන්, තරුනයින් හා ශිෂ්‍යයන් බොහෝ කොටසක් කෙරෙහි දක්වන පාලන සංස්ථාපිතයේ ගැඹුරුම භීතියයි.

ස්නෝඩන් බලගතු සහායක් දිනාගනු ඇත්තේ ද ඔහුගේ සැබෑ ආරක්ෂාව සැලසෙනු ඇත්තේ ද ජනගහනයේ මෙම පුලුල් ස්ථරයන් තුල පමනි. එය, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමග පෙල ගැසීමට බලා සිටින හා තමන්ගේම පාලක පන්තීන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට උත්සුක වන ලතින් ඇමරිකාවේ ධනපති ජාතිකවාදී ආන්ඩු අත හෝ මොස්කෝවේ රුසියානු කතිපායාධිකාරය නියෝජනය කරන ව්ලැඩිමීර් පුටින්ගේ දූෂිත තන්ත්‍රය අත තැබිය නොහැකිය.

එක්සත් ජනපදයේ හා අනෙක් සෑම රටකම කම්කරු පන්තිය පමනක්, ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂාව සඳහා එකම අව්‍යාජ බලවේගය වන්නේය. එක්සත් ජනපදය හා ලෝකය පුරා ධනවත් පාලක ස්ථරයන් වැලඳගෙන සිටින පොලිස් රාජ්‍ය පියවරයන්ට එරෙහිව ශක්‍ය ප්‍රතිරෝධයක් එල්ල කල හැක්කේ කම්කරු පන්තියට පමනි. ධනපතියන් ආරක්ෂා කිරීමට කැපව සිටින්නේ, දැවැන්ත සමාජ අසමානතාවෙන් ද ආර්ථික සූරාකෑම හා දේශපාලන මර්දනය මගින් ද අංග ලක්ෂිත පද්ධතියකි.

"ස්නෝඩන්ට අත නොතබනු!" යන ඉල්ලීම වටා එක්සත් ජනපදයේ ද ලෝකයේ ද කම්කරු වැඩපලවල, පාසැල්වල හා නිවහන් ප්‍රදේශවල මහජන සහයෝගය රැලිකල යුතුය. ඔහුගේ ආරක්ෂාව, ඔහු මෙන්ම එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අපරාධ හෙලිදරව් කිරීමේ හේතුව මත රාජ්‍ය මර්දනයට මුහුනපා සිටින, බ්‍රැඩ්ලි මැනිං හමුදා භටයාගේ ද ජූලියන් අසාන්ජ්ගේ ද ආරක්ෂාව සමග බැඳී ඇත. මෙම අරගලය, ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමේ ද යුද්ධයේ හා ආඥාදායකත්වයේ තර්ජනය ගෙන එන ධනපති ලාභ පද්ධතියට එරෙහිව ද යොමු කරන හී තුඩ බවට පත්කල යුතුය.

**බිල් වැන් ඕකන්**

© www.wsws.org